Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# වර්ෂ 2022 මැයි සහ ජූලි මාසවලදී ප්‍රකාශයට පත් කරන ලද හදිසි අවස්ථා නියෝග

වර්ෂ 2022 ජූලි 17 වැනි දින වැඩබලන ජනාධිපති (එවකට ඔහු දැරූ නිලය පරිදි) රනිල් වික්‍රමසිංහ විසින් වර්ෂ 2022 ජූලි 18 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අංක 2288/30 අති විශේෂ ගැසට් නිවේදනය මගින් හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරන ලදී. ඉන් අනතුරුව, වර්ෂ 2022 ජූලි 18 වැනි දිනැති 2022 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝග ඔහු විසින් අංක 2289/07 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් බලාත්මක කරන ලදී. මෙම රෙගුලාසි හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් වර්ෂ 2022 මැයි මාසයේදී බලාත්මක කරන ලද එම නමින්ම පනවන ලද හදිසි අවස්ථා නියෝග වලට බොහෝ දුරට සමාන වන නමුදු වත්මන් ජනාධිපතිවරයා විසින් පනවා ඇති හදිසි නියෝගයන්හි භයානකත්වය තව තවත් තීව්‍ර කරමින් සුළු වෙනස්කම් දෙකක් පෙන්නුම් කෙරෙන අතර එමගින් දණ්ඩ නීති සංග්‍රහයේ 408-426 වගන්ති ඉහත කී හදිසි අවස්ථා නියෝග අංක 12 යටතේ ඇති වැරදි ලැයිස්තුවට එක් කර ඇති අතර, 17(2) රෙගුලාසිය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීමට පෙර සැකකරුවෙකු රඳවා තබා ගැනීමේ කාලය පැය 24 සිට පැය 72 දක්වා දීර්ඝ කර ඇත.

වර්ෂ 2022 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝගයන්හි සමහර කරුණු හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති අයිතිවාසිකම් සහ නිදහස කෙරෙහි ඇති කළ හැකි බලපෑම විමසීමට ලක් කිරීම මෙම ලේඛනය මගින් අපේක්ෂා කෙරේ.

ඒ සඳහා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අදාළ වන හදිසි අවස්ථා නියෝග පිළිබඳව විමසීමක් මෙමගින් කරනු ලැබේ;

1) සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම,

2) වැරදි (නව වැරදි ඇතුළුව),

3) අත්‍යාවශ්‍ය සේවා,

4) විමර්ශන සහ නීතිපතිවරයාගේ බලතල.

මෙහිදී සඳහන් කළ යුතු මූලික කරුණක් වන්නේ අර්බුදකාරී කාලවලදී පවා බලය සාධාරණව හා පවතින අවශ්‍යතාවයට සමානුපාතිකව ක්‍රියාත්මක කළ යුතු බවත්, මෙම හදිසි අවස්ථා නියෝග හරහා වර්තමානයේ පවතින මර්දනකාරී වාතාවරණය තවදුරටත් ශක්තිමත් කරන අන්දමින් අසමානුපාතික සහ අසාධාරණ අන්දමින් බලය ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබී ඇති බවත් නැවත අවධාරණය කළ යුතුය.

හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් සති 5ක් තුළ දෙවන වරටත්, ස්වකීය ජනාධිපති ධූර කාලය තුළ තුන්වන වරටත් වර්ෂ 2022 මැයි 6 වන දින සිට බලපැවැත්වෙන පරිදි හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කරන ලදී. මීට පෙර ඔහු විසින් වර්ෂ 2022 අප්‍රේල් 01 වන දින ප්‍රකාශයට පත් කරන ලද හදිසි අවස්ථා තත්ත්වය වර්ෂ 2022 අප්‍රේල් 5 වැනි දින අවලංගු කරන ලද අතර, ඒ යටතේ හදිසි නීති රෙගුලාසි ප්‍රකාශයට පත් කර නැත. කෙසේ වෙතත්, මැයි 6 වැනි දින හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, ජනාධිපතිවරයා විසින් වර්ෂ 2022 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) රෙගුලාසි අංක 2278/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් බලාත්මක කරන ලදී.

Centre for Policy Alternatives
Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් මහජන විරෝධතා නැවැත්වීමට සිදු වූ බවට ප්‍රකාශයන් තිබුණ ද, හදිසි අවස්ථා ප්‍රකාශයට පත්කිරීමක් එනයින්ම පවතින නීතිවලට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් වලට බල නොපාන බැවින් එවැනි ප්‍රකාශ අසත්‍ය ඒවා විය. හදිසි අවස්ථා ප්‍රකාශය මඟින් ඕනෑම නීතියක් අභිබවා යාමේ හැකියාව ඇති හදිසි අවස්ථා නියෝග සැකසීමේ ඉඩ ප්‍රස්ථාව ජනාධිපතිවරයාට  ලැබෙන නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අභිබවා යා නොහැකිය. කෙසේ වෙතත්, මෙකී හදිසි අවස්ථා රෙගුලාසිවලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති සමහර මූලික අයිතිවාසිකම් යටපත් කළ හැකි සීමිත පදනම් (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15(7) ව්‍යවස්ථාව ප්‍රකාරව) කිහිපයක් තිබේ. මෑත කාලීන හදිසි නීති රෙගුලාසිවල අඩංගු සමහර නියෝග හරහා විරෝධය දැක්වීමේ අයිතිය සහ විසම්මුතිය ප්‍රකාශ කිරීමේ නිදහස යටපත් කිරීමේ බලපෑමක් ඇති විය හැකිය.

කෙසේ වෙතත්, මූලික අයිතිවාසිකම් අයදුම්පත්‍රයක් මගින් මෙකී හදිසි අවස්ථා රෙගුලාසි අභියෝගයට ලක් කරනු ලැබිය හැක. හදිසි නීති රෙගුලාසි මගින් සාධාරණත්වය සහ සමානුපාතිකත්වය පිළිබඳ ප්‍රමිතීන් සපුරාලිය යුතු බවට අධිකරණ මගින් මීට පෙර තීරණය කර ඇත. තවද, දින 14ක් ඇතුළත (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(6) ව්‍යවස්ථාව) පාර්ලිමේන්තුව විසින් අනුමත නොකළහොත් එකී හදිසි අවස්ථා රෙගුලාසි අවලංගු වේ. හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම ද දින 14ක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු අතර එසේ නැතහොත් එය අවලංගු වූ ලෙසට සැලකේ. අප්‍රේල් 01 වැනි දින සිට බලපැවැත්වෙන බවට ප්‍රකාශයට පත් කළ හදිසි අවස්ථා තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සිදු කර කඩිනමින්ම එය අවලංගු කරන ලද අතර එය පාර්ලිමේන්තුව හමුවේ පරීක්ෂා නොකළ නමුත් වෙනත් කරුණු අතර, හදිසි තත්වයක් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් වන නීත්‍යානුකූල භාවය අභියෝගයට ලක් කළ මූලික අයිතිවාසිකම් අයදුම්පත් කිහිපයක් ඉදිරියට ගෙන යාමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වර්ෂ 2022 අප්‍රේල් 7 වැනි දින අවසර දෙන ලදී. වර්ෂ 2022 මැයි 6 වැනි දින හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම සහ ඉන් පසුව ඒ මත පදනම්ව සකසන ලද හදිසි අවස්ථා නියෝග අභියෝගයට ලක් කරමින් වර්ෂ 2022 ජූනි 6 වැනි දින, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ගොනු කරන ලදී.

ශ්‍රී ලංකාව මාස ගණනාවක් තිස්සේ ආර්ථික අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දී සිටින අතර, ජනාධිපතිවරුන් විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කළ කිසිදු අවස්ථාවක එවැනි ප්‍රකාශයක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් නොවීය. වර්ෂ 2021 අගෝස්තු මාසයේදී, ආහාර හිඟය ප්‍රථම වරට පැන නැගීමට පටන් ගත් විට හදිසි අවස්ථාව ප්‍රකාශයට පත් කරන ලද අතර, ඒ අවස්ථාවේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් එකී හදිසි අවස්ථා ප්‍රකාශයේ සුවිශේෂ කරුණු සහ එවැන්නක් අනවශ්‍ය වීමටත් සහ අසාධාරණ වීමටත් හේතු පාදක වන තත්ත්වයන් සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන ලදී. වර්ෂ 2022 අප්‍රේල් මාසයේදී හදිසි නීතිය ප්‍රකාශයට පත් කරනු ලැබුවේ ජනාධිපතිවරයාට එරෙහිව මහජන විරෝධතා පැවැත්වීමට නියමිතව තිබියදී මහජනතාවගේ යහපත සඳහා නොව ඔහුගේ පෞද්ගලික ආරක්ෂාව සඳහා බව මෙහිදී සඳහන් කළ යුතුය.

වත්මන් ජනාධිපතිවරයා විසින් ද උක්ත කී අන්දමින් ම ජාතික හෝ මහජන ආරක්ෂාවට තර්ජනයක් නොවන හේතූන් මත හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කර ඇති බව පෙනේ. මේ අනුව, වත්මන් ජනාධිපතිවරයා මෙන්ම හිටපු ජනාධිපතිවරයා ද පෙන්නුම් කර ඇත්තේ හදිසි අවස්ථා හා බැඳි බලතල අවභාවිත කරමින්, එමගින් දැනටමත් අනවශ්‍ය පරිදි ප්‍රමාණය ඉක්මවා බල සම්පන්න කර ඇති විධායකයට තවදුරටත් වැඩි බලයක් පැවරීමේ රටාවෙහි ප්‍රවණතාවයයි.


Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

## සෝදිසි කිරීම, අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම

11 වන නියෝගය

මෙම නියෝගය මගින් නිශ්චිත වැරදි කිහිපයක් සම්බන්ධයෙන් සෝදිසි කිරීම සහ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පොලිසියට සහ සන්නද්ධ හමුදාවට පුළුල් බලතල ලබා දේ. එම ඡේදයට අනුව;

ඕනෑම පොලිස් නිලධාරියෙකුට හෝ සන්නද්ධ හමුදාවේ ඕනෑම සාමාජිකයෙකුට;

දණ්ඩ නීති සංග්‍රහයේ පහත සඳහන් කවර හෝ වරදක්

1. කරන්නා වූ;
2. කරනු ලැබ ඇති;
3. වරදක් හා සම්බන්ධ බවට හෝ වරදක් කරනු ලැබූ බවට සැක කරනු ලැබීමට යුක්ති සහගත හේතු අත්තා වූ හෝ;

යම් තැනැත්තකු

1. සෝදිසි කිරීම
2. සෝදිසි කිරීමේ කාර්යය සඳහා රඳවා තබා ගැනීම; හෝ
3. අත්අඩංගුවට ගැනීම සිදු කළ හැකිය.

Centre for Policy Alternatives
Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

| වගන්තිය | |
|---|---|
| 345 | හිරිහැර කිරීමේ අදහසින් ස්ත්‍රියකට අඩන්තේට්ටම් කිරීම හෝ සාපරාධී බලහත්කාරය |
| 354 | අපහරණය |
| 355 | මිනී මැරීම සඳහා අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම |
| 356 | රහසිගතව හා අයුතු ලෙස යම් තැනැත්තකු සිරකර තැබීමේ අදහසින් අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම |
| 357 | යම් ස්ත්‍රියක විවාහ කරවීමේ ආදිය පිණිස ඇය අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම |
| 358 | බරපතල තුවාල කිරීමකට හෝ වහල් බවට ගැනීම් ආදියකට යම් තැනැත්තකු යටත් කරවීම සඳහා අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම |
| 359 | අපහරණය කරනු ලැබූ තැනැත්තකු අයුතු ලෙස සැඟවීම හෝ සිර කර තබා ගැනීම |
| 360 | වයස අවුරුදු දහයට අඩු දරුවකුගේ ශරීරයෙන් චංචල දේපළ සොරකම් කිරීමේ අදහසින් එබඳු ළමයකු අපහරණය කිරීම හෝ පැහැර ගෙන යාම |
| 360අ | ස්ත්‍රීන් සැපයීම (නීති විරෝධී ලිංගික සංසර්ගය හෝ ගණිකා වෘත්තිය සඳහා) |
| 360ආ | ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම |
| 360ඇ | තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද |
| 364 | ස්ත්‍රී දූෂණය |
| 365 | අස්වභාවික වැරදි |
| 365 අ | තැනැත්තන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා (පුරුෂයන් අතර තදබල අශෝබන ක්‍රියා සම්බන්ධයෙන් අභිචෝදනා ගොනු කිරීමට භාවිත කරනු ලබන වරද) |
| 365 ආ | බරපතල ලිංගික අපයෝජනය |
| 427 | සාපරාධී අයුතු ඇතුළු වීම |
| 428 | ගෙයකට අයුතු ඇතුළු වීම |
| 429 | සැඟව සිට ගෙයකට ඇතුළු වීම |
| 430 | රාත්‍රියේ සැඟව සිට ගෙයකට ඇතුළු වීම |
| 431 | ගෙවල් බිඳීම |
| 432 | රාත්‍රියේ ගෙවල් බිඳීම |
| 433 - | අදාළ වරද සිදු කරනු ලබන චේතනාව සහ වේලාව අනුව සාපරාධී අයුතු ඇතුළු වීම සහ |
| 446 | ගෙවල් බිඳීම සම්බන්ධයෙන් ඇති විවිධ වරදවල් පිළිබඳ තත්ත්වයන් |

උක්ත ලැයිස්තුවේ ඇති සමහර වැරදි, විශේෂයෙන්ම ලිංගික අපරාධ, ක්ෂණික නොසන්සුන්තාවයක් පිළිබඳව වන තත්ත්වයක් හා කුමන අන්දමේ සම්බන්ධයක් තිබේ ද සහ ඒවා මෙම රෙගුලාසිවලට ඇතුළත් කර ඇත්තේ කවර හේතුවක් නිසා ද යන්න පැහැදිලි නැත. පසුගිය කාලයේ LGBTQIA ප්‍රජාව (සමරිසි සහ ද්වි ලිංගික, සංක්‍රාන්ති ලිංගික, අන්තර් ලිංගික, අලිංගික ආදී වශයෙන් වූ තැනැත්තන්) බිය ගැන්වීමට සහ එකී ප්‍රජා කණ්ඩායම් නියෝජනය කරනු ලබන තැනැත්තන්ට අඩන්තේට්ටම් කිරීමට යොදාගත් දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365අ යන වගන්ති මෙකී හදිසි අවස්ථා නියෝග සඳහා ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු වේ.

අදාළ අත්අඩංගුවට ගැනීම පොලිස් නිලධාරියෙකු විසින් සිදු කර ඇති විට, අත්අඩංගුවට ගත් පුද්ගලයා ළඟම ඇති පොලිස් ස්ථානය වෙත ගෙන යා යුතුය (නියෝග 11 (3)). කෙසේ වෙතත්, අත්අඩංගුවට ගැනීම සන්නද්ධ හමුදා සාමාජිකයෙකු විසින් සිදු කරනු ලබන විට, අත් අඩංගුවට ගත් පුද්ගලයා අත්අඩංගුවට ගෙන පැය 24 ක් ඇතුළත ළඟම ඇති පොලිස් ස්ථානයට භාර දිය යුතුය (නියෝග 11 (2)). මෙයින් අදහස් කරනු ලබන්නේ එසේ අත්අඩංගුවට ගත් පුද්ගලයාව දිනක් දක්වා කාලයකට හෙළි නොකළ ස්ථානයක අත්අඩංගුවේ තබා ගැනීමට සන්නද්ධ හමුදාවට හැකි බවයි.

නියෝග 11(6) හි සඳහන් වන පරිදි අත්අඩංගුවට ගන්නා නිලධාරියා විසින් අදාළ අත්අඩංගුවට ගැනීම (පොලිස් නිලධාරියෙකු විසින් අදාළ ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට සහ සන්නද්ධ හමුදා නිලධාරියෙකු විසින් අදාළ අත්අඩංගුවට ගැනීම සිදු කරන ප්‍රදේශයේ අණදෙන නිලධාරියාට) වාර්තා කළ යුතු වන්නේ පැය 24 ක් ඇතුළත පමණක් නිසාවෙන් උක්ත කී තත්ත්වය වඩාත් අහිතකර ස්වාභාවයකට පත් වේ. මෙම ඡේද වල ඇති විධි විධානයන්ගේ සංකලනයකින් අදහස් වන්නේ අත්අඩංගුවට ගත් පුද්ගලයෙකුට පැය 24ක් දක්වා වූ කාලයකට නීතියේ ආරක්ෂාවක් නොමැති විය හැකි අතර, ඔහුගේ පවුලේ අයට හෝ නීතිඥයින්ට පවා එසේ අත් අඩංගුවට පත් වූවන් සිටින්නේ කොහේදැයි නොදැන සිටීමට සිදු වීම හෝ එම කාලය තුළ එවන් ස්ථානයක් වෙත ප්‍රවේශ වීමට නොහැකි වනු ඇති බවයි.

පොලිසියෙහි/සන්නද්ධ හමුදාවෙහි නිලධාරියකු සෝදිසි කිරීම සිදු කරන විට, සෝදිසි කිරීමේ අරමුණට අදාළ කරුණු සම්බන්ධයෙන් සෝදිසි කරන පුද්ගලයා හෝ එම පරිශ්‍රයේ, ස්ථානයේ හෝ වාහනයේ සිටින වෙනත් ඕනෑම පුද්ගලයෙකුගෙන් ප්‍රශ්න කළ හැකි අතර (නියෝග 11(4)), එවැනි පුද්ගලයකු තමන් දන්නා යම් කරුණක් වේ නම් ඒ සම්බන්ධයෙන් තොරතුරු සැපයීමට බැඳී සිටී (නියෝග 11(5)). ස්ත්‍රියක සෝදිසි කිරීමට අවශ්‍ය වු අවස්ථාවක දී, අදාළ සෝදිසිය සිදු කළ යුත්තේ ද වෙනත් කාන්තා නිලධාරිනියකට පමණි (නියෝග 11(8)).

පොලිසියෙහි/සන්නද්ධ හමුදාවෙහි නිලධාරියකු සෝදිසි කිරීම සිදු කරන විට, එසේ සෝදිසි කිරීමට අපේක්ෂා කරනු ලබන ස්ථානයට හෝ වාහනයට ඇතුළු වීමට ඕනෑම අභ්‍යන්තර හෝ පිටත දොරක් හෝ ජනේලයක් හෝ කඩා විවෘත කිරීමට ද අවසර ඇති අතර (නියෝග 11(7)), මෙම නියෝගය යටතේ ඕනෑම දේපළක් තහනමට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට ඔවුන්ට හැකි අතර, එවැනි දේපළක් එම අවස්ථාවේ පැවතියේ යම් තැනැත්තකුගේ භාරයේ ද, එකී තැනැත්තා වෙත ඒ සම්බන්ධයෙන් ලදුපතක් ලබා දිය යුතුය (නියෝග 11(10)).


Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

11 වන නියෝගය මගින් සෝදිසි කිරීම සහ අත්අඩංගුවට ගැනීම සම්බන්ධව තත්ත්වයන් ඉදිරිපත් කිරීම අදහස් කරනු ලැබුව ද, එහි (11) සහ (12) යන උප නියෝග එකී මුඛ්‍ය විෂය පථයෙන් ඔබ්බට යන අන්දමේ බලතල සපයයි. ඒ අනුව ගත් කළ, 11(11) නියෝගය මගින් ජනාධිපතිවරයා විසින් නිශ්චිතව දක්වා ඇති ඕනෑම ව්‍යතිරේකයකට යටත්ව රටේ ඕනෑම ප්‍රදේශයක ඕනෑම මහජන පෙළපාලියක් හෝ මහජන රැස්වීමක් තහනම් කිරීමේ නියෝග නිකුත් කිරීමට බලය ලබා දෙයි. එමෙන්ම, 11(12) නියෝගය මගින් ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක පොලිස් ස්ථානයක ස්ථානාධිපතිවරයාගේ අවසර පත්‍රයක් යටතේ මිස, නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් තුළ කිසිදු පුද්ගලයෙකු කිසිදු ප්‍රසිද්ධ ස්ථානයක රැඳී නොසිටිය යුතු බවට නියෝගයක් කිරීමට පොලිස්පතිවරයාට අවසර දෙනු ලබයි.

සිරභාරයට ගත් පුද්ගලයෙකු රඳවා තබා ගැනීමේ ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් වන විධිවිධාන 17 වන නියෝගයෙහි දක්නට ලැබේ. මෙකී රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු විසින් නිකුත් කරන ලද නියමයක් ප්‍රකාරව විමර්ශන කටයුතු සඳහා රඳවා තබා ගත හැකි අතර, එමගින් පෙන්වා දී ඇති කොන්දේසි වලට අනුකූලව එවන් තැනැත්තකු සති දෙකක් දක්වා කාලයක් දක්වා රඳවා තබනු ලැබිය හැකිය (නියෝග 17(1)).

17(2) නියෝගය මගින් සිරභාරයට ගත් පුද්ගලයෙකු හැකිතාක් ඉක්මනින් පොලිස් ස්ථානයකට රැගෙන යා යුතු අතර පැය 72 ක් දක්වා වූ කාලසීමාවකට රඳවා තබා ගත හැකි බවත්, ඉන් පසු 'එම නියෝග ප්‍රකාරව නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් එම තැනැත්තා රඳවා ගැනීම සඳහා නියමයක් කර ඇත්නම් මිස', ඔවුන්ව මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බවත් සඳහන් කරයි. ජනාධිපති රාජපක්ෂගේ හදිසි අවස්ථා රෙගුලාසි වලට අනුව, එවැනි රඳවා තබා ගැනීමට අවසර දී ඇත්තේ පැය 24 ක් පමණක් වන නමුදු, ජනාධිපති වික්‍රමසිංහගේ රෙගුලාසි යටතේ, එකී රැඳවුම් කාලය පැය 72 දක්වා දීර්ඝ කර ඇත.

තවද, ''එම නියෝග ප්‍රකාරව නියෝජ්‍ය පොලිස්පතිවරයකු විසින් රැඳවුම් නියෝගයක් නිකුත් කරන්නේ නම්'', යම් පුද්ගලයකු අධිකරණයට ඉදිරිපත් කිරීමට පෙර සති දෙකක් දක්වා වූ කාලසීමාවක් රඳවා තබා ගත හැකිය. මෙම විධිවිධානය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ ඇති රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් වන විධිවිධාන වලටත් වඩා දැඩි ස්වරූපයක් ගනී.

කෙසේ වෙතත්, මෙම පරිපාලන රඳවා තබා ගැනීමේදී (නියෝග 17(3) සහ (4)), (නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් නියම කර ඇති කොන්දේසිවලට යටත්ව වුවද) එසේ රඳවාගෙන සිටින පුද්ගලයාගේ පවුලේ ඥාතීන් සමග සන්නිවේදනය කළ හැකි අතර, ඔවුන්ගේ නීතිඥවරයාට ඔවුන් වෙත ප්‍රවේශ වී ඔවුන් වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම සඳහා ස්වකීය නියෝජනය තහවුරු කළ හැකිය.

# වැරදි

## 12 වන නියෝගය

මෙම නියෝගය මගින් අදාළ වරද සිදු කරනු ලබන අවස්ථාවේ දී හෝ ඒ ආසන්න වෙලාවක දී හෝ පැවති සිවිල් කැළඹීමක් සඳහා හෝ වර්ගවාදී අභිප්‍රේරක කැරලි සඳහා ආධාර කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ එවැන්නක් අතරතුර දී සිදු කරන ලදැයි නීතිපතිවරයාගේ මතය අනුව සෑහීමකට පත් වන්නේ නම්, දණ්ඩ නීති සංග්‍රහය මගින් පෙන්වා දී ඇති වැරදි කිහිපයකට වඩාත් දැඩි දඬුවම් පැනවීමක් සිදු කෙරේ (නියෝග 12(3)). 12(1) නියෝගය අනුව;

- දේපළකට විනාශයක් කිරීම හෝ හානි කිරීම හෝ එබඳු යම් දේපළක වටිනාකම හෝ ප්‍රයෝජනය නැති කරන හෝ අඩු කරන ක්‍රියාවක් කරන (එය පොදු දේපළ විය යුතු යැයි නිශ්චිතව දක්වා නැත),
- මරණයට පත් කිරීමට හෝ තුවාල සිදු කිරීමට කටයුතු සිදු කරන හෝ තැත් කරන,
- සාපරාධී තැතිගැන්වීම හෝ අඩත්තේට්ටම් කිරීම සිදු කරන,
- පදිංචිය හිස්කොට තිබෙන හෝ  අනාරක්ෂිතව ඇති හෝ අලාභහානි සිදු කොට ඇති හෝ විනාශයට පත් කොට ඇති යම් පරිශ්‍රයකින් යම් භාණ්ඩයක් සොරකම් කරන,
- 11(1) නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති ඕනෑම ලිංගික අපරාධයක් සිදු කරන;
- යම් දේපළක සොරකම, ත්‍රාසාද්ග්‍රහණයක් හෝ කොල්ලකෑම සිදු කරන,
- දණ්ඩ නීති සංග්‍රහයේ 408 - 426 වගන්තිවල අනර්ථකාරී ක්‍රියා සිදු කරන සහ
- 11(1) නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති දේපළ හා බැඳි වරදක් සිදු කරන හෝ යම් පරිශ්‍රයකින් බඩු බාහිරාදිය හෝ ද්‍රව්‍ය නීති විරෝධී සුන්බුන් නීතිවිරෝධී ලෙස ඉවත් කරන,
- දණ්ඩ නීති සංග්‍රහයේ 138 වගන්තියට අනුව අර්ථ දක්වා ඇති පරිදි නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වන,

යම් තැනැත්තකු වරදක් සිදු කරනු ලබන අතර, ඒ සඳහා මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කිරීමකට හෝ වසර විස්සක කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ යටත් කළ හැකිය. මෙම වගන්තිය මගින් සිදු කරනු ලබන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ දැනටමත් ඇති වැරදි සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇති සිරදඬුවමට වඩා ඉතා දරුණු සිර දණ්ඩනයක් එක් කර තිබීමයි. නිදසුනක් වශයෙන්, දණ්ඩ නීති සංග්‍රහය (433 වගන්තිය) යටතේ සාපරාධී අයුතු ඇතුළුවීම සඳහා දඬුවම මාස 3 දක්වා සිරදඬුවමක් හෝ රුපියල් දහසක් දක්වා දඩයක් පනවනු ලබන අතර, මෙම රෙගුලාසි යටතේ වරදකරුවෙකුට ඒ වෙනුවට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් නියම කළ හැකිය.

ජනාධිපති වික්‍රමසිංහ විසින් බලපවත්වන ලද රෙගුලාසිවල දණ්ඩ නීති සංග්‍රහයේ 408 - 426 වගන්ති යටතේ (ඉහත විස්තර කර ඇති) වැරදි ඇතුළත් කිරීම ජනාධිපති රාජපක්ෂගේ රෙගුලාසිවල දක්නට නොලැබීම විශේෂත්වයකි.

මීට අමතරව, මෙම වගන්තිය වසර විස්සක අනිවාර්ය අවම දඬුවමක් නියම කිරීමට අපේක්ෂා කරනු ලබයි. අපගේ නීතියේ ඇති බොහෝ වැරදි සඳහා විනිසුරුවරයෙකුට ඉක්මවිය නොහැකි උපරිම දඬුවමක් පමණක් ලබා දෙන අතර, එවැනි උපරිම කාල සීමාවකට යටත්ව ඊට වඩා අඩු කාලයකට සුදුසු ඕනෑම දඬුවමක් ලබා දීම විනිසුරුවරයාගේ අභිමතය පරිදි වේ. කෙසේ වෙතත්, කෙසේ නමුත් මෙහිදී, 'අවුරුදු විස්සක් දක්වා' දිවෙන්නේ නැත. එසේ කිරීමට කිසිදු පදනමක් නොමැතිව ජාතික ආරක්ෂාවට කිසිදු සම්බන්ධයක් නොමැති මෙවැනි දරුණු දඬුවම් වලට ඉඩ ප්‍රස්ථාව ලබා දීම අසාධාරණ ලෙස හදිසි අවස්ථා නියෝග පැනවීමේ බලතල භාවිත කිරීමකි.

තවද, දණ්ඩ නීති සංග්‍රහයේ 96 වැනි වගන්තිය මගින් වෙනත් පුද්ගලයෙකුගේ මරණය සිදු කිරීම පුද්ගලික ආරක්ෂාව (ආත්ම ආරක්ෂාව) බවට පත්වන අවස්ථා සම්බන්ධයෙන් විධිවිධාන සපයයි. ඉහත කී 12 වන නියෝගයෙහි සඳහන් වරදක් සිදු කරන ඕනෑම අවස්ථාවක සම්බන්ධයෙන් එකී අවස්ථාවන් පුළුල් කර තිබීම 12(2) නියෝගය මගින් සිදු කර තිබේ. මේ අනුව, පෙන්වා දී ඇති තත්වයන් තුළ සොරකමක් සිදු වුවද, දේපල හිමිකරුට සොරකම් කරන පුද්ගලයාගේ මරණය සිදු කළ හැකි අතර එය ආත්මාරක්ෂාව සඳහා වූ ක්‍රියාවක් යැයි පැවසිය හැකිය.

## නව වැරදි

නියෝග 13 - 16 සහ 18 - 22, 25 සහ 38

සාමාන්‍ය නීතියේ අන්තර්ගත කොටසක් නොවන වෙනත් වැරදි කිහිපයක් මෙකී රෙගුලාසිවල අඩංගු වේ. එකී වරදවල් වන්නේ;

**නියෝග 13** - රජයේ නිලධාරයන් වන හෝ ජනරජයේ සේවයෙහි යෙදී සිටින හෝ අතවශය සේවාවන් ඉටු කිරීමේ යෙදී සිටින තැනැත්තන් අතර අසහනකාරී බව ඇති කිරීමට ප්‍රයත්න දැරීම (එවන් නිලධරයන් ලෙස ස්වකීය කාර්යය උල්ලංඝනය වන අන්දමින් පේ‍්‍රරණය කිරීමට ප්‍රයත්න දැරීම ද ඇතුළුව).

අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ සමාගමයේ නිදහස (විරෝධතා දැක්වීමේ අයිතිය) යටපත් කිරීමට මෙම නියෝගය භාවිතා කළ හැකි වන්නේ ප්‍රයත්න දැරීම යනු කුමක්ද යන්න මෙකී නියෝගයන් මගින් පැහැදිලි කර නොමැති වීම හේතුවෙනි.

**නියෝග 14** - මහජන ආරක්ෂාවට, මහජන සාමයට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් සහ සේවා පවත්වාගෙ යාමට අගතිගාමී වන කරුණු අඩංගු දැන්වීම් කොළ, අත් පත්‍රිකා හෝ පත්‍රිකා මහජනයාට පෙනෙන යම් ස්ථානයක ඇලවීම හෝ මහජනයා අතර බෙදාහැරීම නොකළ යුතු බව.

මෙමගින් පැහැදිලිවම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීම සිදු වේ. අදාළ තොරතුරු සත්‍ය සහ නිවැරදි වුවද, ඒවායින් රාජ්‍යයට අගතියක් වන ඕනෑම තොරතුරක් බෙදා හැරීම මැඩපැවැත්වීම සඳහා මෙම නියෝගය අනිසි ලෙස භාවිතා කළ හැකිය.


Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

නියෝග 15 - මහජනයා බියවැද්දිය හැකි හෝ මහජනයා කැලඹිය හැකි හෝ වාර්ගික ප්‍රචණ්ඩත්වයට හේතු විය හැකි හෝ වරදක් කිරීමට පෙළඹවිය හැකි කිසිදු කටකතාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් හෝ යම් තොරතුරක් හෝ පින්තූරයක් පණිවුඩයක් කට වචනයෙන් හෝ ඩිජිටල් ක්‍රමයකින් (සමාජ මාධ්‍ය ඇතුළුව) සන්නිවේදනය කිරීම හෝ පැතිරවීම.

මෙම විශේෂිත නියෝගයෙහි භාවිත කර ඇති වචන අපැහැදිලි නමුදු, මෙම නියෝගයේ වපසරිය තුළට ගැනෙන්නේ අසත්‍ය ප්‍රකාශ පමණක් නොව, මහජන කැළඹීමක්, නොසන්සුන්තාවයක් ආදී වශයෙන් වූ තත්ත්වයන් ආදිය ඇති කළ හැකි ඕනෑම තොරතුරක් හෝ පින්තූරයක් ද අයත් වන බව පෙනේ. මෙමගින් පැහැදිලිවම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීම සිදු වේ. වර්ෂ 2005 සිට යුධ සමයේ සිට ක්‍රියාත්මක වූ හදිසි නීති රෙගුලාසිවලට කටකතා සහ අසත්‍ය ප්‍රකාශ වැලැක්වීමේ ප්‍රතිපාදන තිබුණද, එය සත්‍ය තොරතුරු ආවරණය වන තත්ත්වයක් දක්වා ව්‍යාප්ත නොවූ අතර, එම නිසා, වර්ෂ 2022 පනවන ලද හදිසි අවස්ථා රෙගුලාසි ක්‍රියාවට යෙදවීමේ දී වඩාත් දැඩි ස්වරූපයක් ගෙන ඇති බව පෙන්නුම් කෙරේ.

නියෝග 16 - යම් හදිසි අවස්ථා නියෝගයක් ප්‍රකාර හෝ එවැනි යම් නියෝගයක් යටතේ කරනු ලැබූ යම් නියමයක් ප්‍රකාර හෝ කරනු ලැබූ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් අසත්‍ය ප්‍රකාශයක් කිරීම.

නියෝග 18 - වෙනත් යම් තැනැත්තකු වාසය කරන හෝ වැඩ කරන හෝ ව්‍යාපාර කටයුතු කරගෙන යන හෝ සිටින ගෙයක නැතහොත් ස්ථානයක සිටින තැනැත්තකු බියගන්වන ආකාරයෙන් හෝ ඒ ගෙයට නැතහොත් ස්ථානයට ඇතුළු වීම හෝ ඉන් පිටවීම අවහිර කෙරෙන ආකාරයෙන් හෝ සාමය කඩවන ආකාරයෙන් සිටීම.

බිය ගැන්වීම යන්නෙන්, තමාට හෝ තම පවුලේ යම් සාමාජිකයකුට හෝ (යම් තැනැත්තකුට ඔහුගේ ව්‍යාපාරයට, වෘත්තියට, සේවා නියුක්තියට, හෝ වෙනත් ආදායම් මාර්ගයකට සාවද්‍ය ක්‍රියාවක් මගින් සිදු කෙරෙන යම් හානියක් හෝ අලාබයක් ද ඇතුළුව) ඔවුන්ගේ දේපළවලට හිංසාවක් හෝ හානියක් සිදු වේ යැයි සාධාරණ හැඟීමක් බියක් ඇති කිරීම ලෙස අර්ථ දැක්වේ. මෙම නියෝගය හරහා විරෝධතා දැක්වීමේ අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ යාම ඊමේ නිදහස ආදිය සීමා කිරීමට භාවිතා කළ හැකි පුළුල් අර්ථකතනයකි.

නියෝග 20 - නීත්‍යානුකූල අධිකාරී බලයකින් තොරව, යම් පොදු මාර්ගයකට, පාලමකට, පොදු මාර්ගයක බෝක්කුවකට, යම් දුම්රිය මාර්ගයකට හෝ යම් පොදු ප්‍රවාහනයේ යෙදෙන වාහනයකට බාධාවක් හෝ හානියක් සිදු කිරීම.

මෙම නියෝගය මගින් ද විරෝධතා දැක්වීමේ අයිතියට අගතිගාමී වන අන්දමින් සමාගමයේ නිදහසට හානිකර ලෙස බලපෑ හැකිය.

නියෝග 21 - මෙම හදිසි අවස්ථා නියෝගයක් යටතේ වන වරදක් සිදු කිරීමට තැත් කරන, ආධාර අනුබල දෙන හෝ කුමන්ත්‍රණය කිරීම ද වරදක් බවට පත් කෙරේ.

නියෝග 22 - යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකු වරදකරු බව දන්නා හෝ විශ්වාස කිරීමට යුක්ති සහගත හේතු ඇති කිසිදු තැනැත්තකු විසින් එකී වරද සඳහා එම තැනැත්තා අල්ලා ගැනීම, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් දීම වැළැක්වීමේ, ඊට බාධා කිරීමේ හෝ මැදිහත් වීමේ අරමුණින් ඒ තැනැත්තාට යම් සහයක් ලබා දීම.


Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

නියෝග 25 - යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් කිරීමට තැත් කිරීම පිළිබඳ චේතනාවක් හෝ සූදානමක් පිළිබඳව හෝ එවැනි වරදක් සිදු කිරීම හෝ පිළිබඳව දැන ගැනීමට ලැබෙන කවරකු වුව ද ඒ සම්බන්ධයෙන් ආසන්නතම ග්‍රාම නිලධාරීවරයාට හෝ ළඟම ඇති පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියාට ලබා දිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වීම වරදක් වේ.

මෙම නියෝගය අපරාධ නඩු විධාන සංග්‍රහයේ (Code of Criminal Procedure - CCP) 21 වැනි වගන්තියට සමාන වන නමුදු අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ වන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ වැරදි සඳහා පමණි. ඉහත සඳහන් කළ නියෝගය හරහා වර්තමානයේ පවතින නිරීක්ෂණ සහ බිය ගැන්වීමේ වාතාවරණය තවදුරටත් තීව්‍ර වීමට දායක වේ.

නියෝග 38 - නිසි බලධාරියා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කිරීමේ දී, රාජ්‍ය ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම සඳහා හෝ යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා ලබා ගැනීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට නිසි බලධරයා හෝ ඉල්ලීම කරනු ලබන තැනැත්තා වෙත යම් තොරතුරක් හෝ භාණ්ඩයක් (පොත්, ගිණුම්, ලේඛන ආදිය ද ඇතුළුව) ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම.

යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක, ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වේ නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම, හෝ ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකුම තමාගේ දැනුම නොමැතිව ඒ වරද කර ඇති බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට නිසි උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී වරද සිදු කළා සේ සැලකේ (නියෝග 23).

යම් රෙගුලාසියක් හෝ ඒ යටතේ කරන ලද යම් නියෝගයකට/විධානයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම තැනැත්තෙකු වරදකට වරදකරු වන අතර, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයක් හෝ මහේස්ත්‍රාත් අධිකරණයක ඉදිරියේ විභාග කරනු ලබන අතර, මාස 3 සිට වසර 5 ක් දක්වා කාලසීමාවකට බරපතල සිරදඬුවම් සහ රු. 500 - සහ රු. 5000 අතර දඩයක් නියම කළ හැකිය.

24(3) නියෝගයේ විධිවිධාන පරිදි, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 වන වගන්තියේ (2) උප වගන්තියේ විධිවිධාන යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධනේ වරදකරුවෙකු තැනැත්තකුට අදාළ නොවිය යුතු බවට කරුණු පෙන්වා දේ. අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ මෙම වගන්තිය වූ කලී, 'චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාගේ චරිතය, පූර්ව ක්‍රියා කලාපය, වයස, සෞඛ්‍ය හෝ මානසික තත්ත්වය හෝ වරදේ අල්ප ස්වභාවය නැතහොත් වරද කරනු ලැබූ අවස්ථාවේ පැවති මන්දිකාරක කරුණු සැලකිල්ලට ගත් විට, යහපත් හැසිරීමෙන් යුක්ත වන බවට කොන්දේසියක් සහිතව අදාළ වරදකරු නිදහස් කරනු ලැබීම (එකී කොන්දේසි සහිත නිදහස් කිරීමේ දින සිට වසර තුනක කාලයක් ඇතුළත අවශ්‍ය නම් එකී වරදට වරදකරුවකු කිරීමේ වගකීම සහිතව) සඳහා විනිශ්චයකාරයකුට ඉඩ ප්‍රස්ථාව ලබා දෙන විධිවිධානයකි.

අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ මෙම වගන්තිය ඉවත් කිරීම වූ කලී අධිකරණ අභිමතය ඉවත් කිරීමක් බවට පත් වන්නේ එවන් තත්ත්වයක දී වඩාත් යුක්තිසහගත සහ සාධාරණ විය හැකි දඬුවමේ ස්වභාවය තීරණය කිරීමට අභිමතය ඇත්තේ අදාල නඩුව අසන විනිසුරුවරයාට වීම නිසාවෙනි.

CPA
Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

## අත්‍යවශ්‍ය සේවා

නියෝග 8 - 10

මහජන සාමය පවත්වාගෙන යාම සහ සුරක්ෂිත කිරීම සඳහා සහ ජන ජීවිතයට අත්‍යවශය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි පෙනී යන්නේ නම්, මෙම නියෝග යටතේ ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් අත්‍යවශ්‍ය සේවා සැපයීමට සහ පවත්වාගෙන යාමට අවශ්‍ය සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම ස්වකීය කාර්යය වශයෙන් පෙන්වා දෙනු ලබන අතවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයකු පත් කරනු ලැබිය හැකිය (නියෝග 8(1)). අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති හෝ නියම කොට ඇති බලතල, කාර්යය, හෝ කර්තව්‍යය වෙනත් අයකු වෙත පවරනු ලැබිය හැකිය. අත්‍යාවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා පවරා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා අන් අයට බලය පැවරීමට ද හැකියාව ඇත (නියෝග 8(3) සහ (5)).

ජන ජීවිතයට අත්‍යාවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට සහ මහජන සාමය පවත්වා ගැනීමට සහ ආරක්ෂා කිරීමට අවශ්‍ය බව පෙනී යන්නේ නම්, ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් යම් සේවාවක් අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය (නියෝග 9(1)). යම් සේවාවක් අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති විට;

එවන් අත්‍යවශ්‍ය සේවයක නියැලී සිටින අයෙක් එකී සේවයට පැමිණීම පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම, හෝ එකී සේවාවට අදාළ ස්වකීය සේවා නියුක්තියේ නියම සහ කොන්දේසි වලට අනුකූලව කටයුතු වල යෙදීමකින් තොරව, එවැනි කාර්යයක් සාමාන්‍ය සේවා කාල හෝරාවක් ඇතුළත වුව ද පිටත වුව ද, සේවයේ යෙදීමෙන් තොරව එකී සේවයේ යෙදීම මඟහැරීම සිදු කරනු ලබන්නේ නම් හෝ එසේ කිරීමට අපොහොසත් වන්නේ නම්, ඔවුන් ස්වකීය සේවා නියුක්තිය අවසන් කළ ලෙස හෝ අත්හරිනු ලැබූ ලෙස සලකනු ලබන්නා සේම, ඊට අමතරව, එවන් අන්දමේ සේවා කටයුතු පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම වැඩ වර්ජනයකට හෝ එවැන්නක් සංවිධානය කිරීමට අදාළ ක්‍රියාකාරකමකට අනුබල දීම හේතුවෙන් සිදු වුව ද, ඔවුන් වරදකට වරදකරු කරනු ලැබේ.

තවද, අනෙකුත් කරුණු අතර, එවැනි සේවාවක් කරගෙන යාමට අවහිර කරන, බාධා කරන, ප්‍රමාද කරන හෝ පරිසීමා කරන, එවන් සේවාවක් කරගෙන යාමෙහි හෝ ඒ හා සම්බන්ධ සේවයේ නියුක්ත වන වෙනත් යම් තැනැත්තකුට ස්වකීය සේවා ස්ථානයට පැමිණීමෙන් වැළැක්වීම සඳහා ප්‍රමාද කරන අවහිර කරන, බාධා කරන, හෝ ඒ සඳහා පොලඹවන, ප්‍රේරණය කරන හෝ දිරි ගන්වන, හෝ යම් තැනැත්තකුට ස්වකීය රැකියාව අත්හැර දැැමීමට හෝ ඉන් ඉවත් වීමට (එසේ ස්වකීය රැකියාව අත්හැර දැමීම හෝ ඉන් ඉවත් වීම සිදු කරනු ලැබුව ද නොලැබුව ද), හෝ රජයේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් වන ඒ සේවාව වෙනුවට වූ නැතහොත් ඊට සමාන්තර වූ වෙනත් යම් සේවාවක් පිහිටු වීමට හෝ පවත්වාගෙන යාමට බලකරන, පොලඹවන, ප්‍රේරණය කරන හෝ දිරි ගන්වන හෝ එවන් සේවාවක් සම්බන්ධයෙන් වන රැකියාවකට අවස්ථාවක් ලබාදීම හෝ රැකියාවක් භාර ගැනීම වළක්වන යම් තැනැත්තකු වසර තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකින් දඬුවමකට යටත් විය යුතුය. මෙම තත්ත්වය යම් භෞතික ක්‍රියාවක් මගින් හෝ යම් භාෂණයක් හෝ ලියවිල්ලක් මගින් වෙනත් යම් තැනැත්තකු පොලඹවන, ප්‍රේරණය කරන හෝ දිරි ගන්වන අවස්ථාවකට වුව ද එකසේ අදාළ වේ.

මේ සම්බන්ධයෙන් බලන විට, 'පොලඹවීම', 'ප්‍රේරණය කිරීම' හෝ 'දිරි ගැන්වීම' ආදී තත්ත්වයන් සම්පූර්ණ වීම සඳහා අදාළ වන නිර්ණායකයන්හි සීමාව කවරක් ද යන්න සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් නොමැති සේම අත්‍යාවශ්‍ය සේවාවක ක්‍රියාකාරීත්වය විවේචනය කරන භාෂණයක් හෝ ලියවිල්ලක් පවා එවන් 'පොලඹවීමක්', 'ප්‍රේරණය කිරීමක්' හෝ 'දිරි ගැන්වීමක්' සිදු කරනු ලබන ක්‍රියාවකට සමානව වරදක් බවට පෙන්වා දී තිබීම කනස්සල්ලට හේතුවකි.

ඒ අන්දමින් පෙන්වා දී ඇති දඬුවමට අමතරව, මෙකී නියෝගයන් මගින් තවදුරටත් පෙන්වා දෙනු ලබන්නේ, 9 වැනි නියෝගය යටතේ සඳහන් කර ඇති වැරදි සම්බන්ධයෙන් යම් තැනැත්තෙකු වරදකරු කරනු ලැබීම හේතුකොට ගෙන, (මේ නියෝගය බලාත්මක වන දිනෙන් පසු එකී තැනැත්තා විසින් සිදු කරන ලද එකී දේපළ අන්සතු කිරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් සිදු කර තිබුණා වුව ද) එම තැනැත්තාගේ සියලු චංචල හෝ නිශ්චල දේපළ ජනරජය සන්තක වූ ලෙසට අධිකරණය විසින් නියෝග කළ යුතු බවයි (නියෝග 9(5)).

මීට අමතරව, යම් සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක් යැයි ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක, අවශ්‍ය යැයි සලකන කවර හෝ විටක දී, අදාළ විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා විමසා, ආරක්ෂක විෂයය පැවරී ඇති අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් එවැනි යම් සේවාවක සේවයේ නියුක්ත වන යම් නිලධරයකුගේ සේවයක් ඉල්ලා සිටිය හැක (නියෝග 9(6)).

ඕනෑම අත්‍යාවශ්‍ය සේවාවක් සම්බන්ධයෙන් නිසි බලධාරියෙකු පත් කිරීමට ද ජනාධිපතිවරයාට හැකියාව ඇති අතර, එම අත්‍යාවශ්‍ය සේවාව පවත්වාගෙන යාම සඳහා භාවිත කරන කිසිදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට අවසරයකින් තොරව ඇතුළුවීමට හෝ රැඳී සිටීමට කිසිදු පුද්ගලයෙකුට නොහැකි බවට නියම කිරීමේ හැකියාව එම නිසි බලධාරියාට ඇත. යම් තැනැත්තෙක් මෙම නියෝගය උල්ලංඝණය කරනු ලබන්නේ නම්, ඔවුන් එම ස්ථානයෙන් හෝ පරිශ්‍රයෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට පොලිසියට, ත්‍රිවිධ හමුදාවට හෝ එසේ කිරීමට බලයලත් වෙනත් ඕනෑම තැනැත්තකුට හැකිය.

## විමර්ශන සහ නඩු විභාග

### නියෝග 25 - 35

වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් විමර්ශනය පොලිස් නිලධාරියෙකුට හෝ හදිසි අවස්ථා නියෝග යටතේ නිසි ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකුට, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ රඳවා ගනු ලැබ සිටින හෝ අත්අඩංගුවේ තබා ගනු ලැබ සිටින ඕනෑම තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ අයිතිය සහ එසේ ප්‍රශ්න කරන කාලය තුළ දී ඒ විමර්ශනයේ කාර්යය සඳහා එම තැනැත්තා යම් ස්ථානයකින් තවත් ස්ථානයකට රැගෙන යාමේ අයිතිය ඇත (නියෝග 28(1)). ඉහත නියෝගය තුළ ''නිසි ලෙස බලය පවරනු ලැබූ තැනැත්තා'' විය හැක්කේ කවරකු ද යන්න පැහැදිලි කරනු ලැබ නැති අතර නියෝග 37(1) හි දක්වා ඇති විධිවිධාන අනුව, යුද්ධ හමුදාපති, නාවික හමුදාපති හෝ ගුවන් හමුදාපති විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ප්‍රශ්න කළ හැකි අතර එසේ ප්‍රශ්න කරන ලද පුද්ගලයා වෙත යොමු කරන ලද ප්‍රශ්නයට පිළිතුරු දීම එකී තැනැත්තාගේ වගකීම විය යුතු බව පෙන්වා දේ.

තවද, කිසියම් තැනැත්තකු රඳවා තබාගෙන හෝ අත්අඩංගුවේ තබාගෙන සිටින කාලසීමාව තුළ, ඒ විමර්ශනයේ කාර්යය සඳහා සාධාරණ කාල වේලාවන්හි දී ඒ තැනැත්තා වෙත ප්‍රවේශ වීමේ අයිතිය කිසියම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධාරියෙකුට ඇත (නියෝග 29). දණ්ඩ නීති සංග්‍රහයේ වැරදි සම්බන්ධයෙන් උක්ත කී අන්දමේ සමාන විධිවිධානයන් අපරාධ නඩු විධාන සංග්‍රහයේ 115(4) වගන්තියේ අඩංගු වේ. කෙසේ වෙතත්, මෙකී හදිසි අවස්ථා රෙගුලිසි වල 35 වන නියෝගය ප්‍රකාරව පෙන්වා දී ඇත්තේ, අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි XI පරිච්ඡේදය (එකී පරිච්ඡේදයෙන් පෙන්වා දෙනු ලබන්නේ පොලිස් නිලධාරීන්ට සහ විමර්ශකයන්ට ලබා දී ඇති තොරතුරුවලට අදාළ විධිවිධාන සහ 115 වගන්තිය ඇතුළුව විමර්ශනය කිරීමට ඔවුන්ගේ බලතල සම්බන්ධයෙන්ය) හදිසි අවස්ථා නියෝග යටතේ පවත්වනු ලබන කිසිදු විමර්ශනයකට අදාළ නොවන බවය.

මීට අමතරව, අපරාධ නඩු විධාන සංග්‍රහයෙහි 115(4) වගන්තිය යටතේ, චූදිතයෙකු ප්‍රශ්න කිරීම සඳහා තැනින් තැනට ගෙනයාමට සහ සාධාරණ වේලාවන් තුළ ප්‍රවේශ වීමට අයිතිය සහතික කිරීමට අධිකරණ අවසරය අවශ්‍ය වේ. එහෙත් වත්මන් හදිසි අවස්ථා නියෝග 28 සහ 29 යටතේ ඇති විධිවිධාන ප්‍රකාරව එවැනි අධිකරණ අවසරයක් අවශ්‍ය නොවේ. අත්අඩංගුවේ දී සහ රැඳවුම් මධ්‍යස්ථානවල දී සිදුවන විවිධ වධ බන්ධන සම්බන්ධයෙන් පොලිසියට එරෙහිව එල්ල වන චෝදනා සැලකිල්ලට ලනු ලබන විට, විශේෂයෙන් අධිකරණමය අධීක්ෂණයක් නොමැති අවස්ථාවක ඉහත කී හදිසි අවස්ථා නියෝග ක්‍රියාත්මක කිරීම වූ කලී දැඩි අවධානයක් යොමු කළ යුතු තත්ත්වයකි.

මෙම හදිසි අවස්ථා නියෝගයන්හි 37(2) නියෝගය මගින් විධිවිධාන සලස්වන පරිදි සිරභාරයට ගෙන රඳවාගෙන සිටින යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා හෝ ''ඒ ප්‍රශ්න කිරීමට සම්බන්ධ වෙනත් යම් කාර්යයක් සඳහා'' ඒ තැනැත්තා එවන් යම් නිලධරයකු විසින් ඔහු රඳවාගෙන සිටින හෝ සිරභාරයේ තබා ගෙන ඇති යම් ස්ථානයකින් ඉවත් කොට එක් වරකට දින හතකට නොවැඩි කාලයක් සඳහා එම නිලධරයාගේ තාවකාලික අත්අඩංගුවේ තබා ගත හැකි බව පෙන්වා දී ඇත. මේ අන්දමින් ස්ථාපිත කර ඇති ඉතා නොපැහැදිලි වචනාර්ථයන් සහිත විධිවිධාන පුළුල් ලෙස අර්ථ දැක්විය හැකි අතර, ඒවා හරහා අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම් සහ වධහිංසාවලින් නිදහස් ව සිටීමේ අයිතිය උල්ලංඝනය කිරීම සඳහා මෙම රෙගුලාසි අනිසි ලෙස භාවිතා කිරීම සහ රැඳවියන්ට ස්වකීය අයිතිවාසිකම් සම්බන්ධයෙන් නිසි නෛතික ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට ලබා දී ඇති නියමිත ක්‍රියාදාමයන්ගේ ආරක්ෂාව ලැබීමට ඇති ප්‍රවේශය ද සීමා කිරීම පිළිබඳ දැඩි ගැටලුකාරී තත්ත්වයක් උද්ගත කරනු ලැබේ.

තවද, කිසියම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් විමර්ශනය කරන පොලිස් නිලධාරියෙකුට හෝ නිසි ලෙස බලය පවරනු ලැබූ වෙනත් තැනැත්තකුට සෑම සියලු සහයෝගයක්ම ලබා දීම සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතු අතර, එසේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තෙක්ම ඔහුගෙන් අසනු ලබන සියලුම ප්‍රශ්න වලට සත්‍යවාදී ලෙස පිළිතුරු දිය යුතු අතර වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, එම තැනැත්තාට එම තොරතුරු හෝ එම ලේඛනයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් දැනුම ලැබී ඇත්තේ කවර අන්දමින් ද යන්න නොසලකා, යම් ලේඛනයක අඩංගු කරුණු ඇතුළුව විමර්ශනයේ විෂයය කරුණට අදාළ සියලු තොරතුරු අනාවරණය කළ යුතුය (නියෝග 28(2)).


Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

එමෙන්ම, එසේ ප්‍රශ්න කරනු ලබන තැනැත්තකු භාරයේ හෝ සන්තකයේ ඇති ලේඛනයක් ඇතුළු යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධාරියා වෙත හෝ නිසි ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකු වෙත හෝ භාරදෙන ලෙස ඒ පොලිස් නිලධාරියා හෝ නිසි ලෙස බලය පවරනු ලැබූ තැනැත්තා විසින් විධානය කරනු ලැබූ විට එසේ භාර දීම එසේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තකුගේම කාර්යය විය යුතු බවට වගකීමක් ද පවරා ඇත (නියෝග 28(3)). මෙම නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ යටතේ නියම කරන ලද කිසියම් කාර්යයක් කඩ කරන යම් තැනැත්තකු මෙම නියෝගවල 24 වන නියෝගය යටතේ වරදක් සිදු කරනු ලබයි (නියෝග 28(4)).

වරප්‍රසාද ලත් සන්නිවේදනය (නීතිඥ-සේවාදායක/වෛද්‍ය-රෝගියා ආදී වශයෙන් වූ) මත මෙම රෙගුලාසියේ ඇති කාර්යය වගකීමේ බලපෑම පිළිබඳ ගැටලු සහගත තත්ත්වයක් පවතී.

මෙකී හදිසි අවස්ථා නියෝගයන්හි 30 වන නියෝගය යම් හදිසි අවවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධාරියෙකු සතු බලතල, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ, ඔහු සතු බලතල වලට අතිරේකව මිස, එමගින් එකී බලතල හීන කිරීමක් නොවිය යුතු බව පෙන්වා දේ. ඒ අනුව, හදිසි අවස්ථා නියෝග මගින් පොලිසියට වැඩි බලතල සහ නිදහස ලබා දෙනු ලබන අතර, එමගින් දැනටමත් සිදුවෙමින් පවතින අධික මිලිටරිකරණය සහ ආරක්ෂාව තහවුරු කිරීමේ නාමයෙන් සිදුවන කටයුතු මෙන්ම මෑත මාසවල සාමකාමී විරෝධතාකරුවන්ට එරෙහිව පොලිස් බලතල අයතා අන්දමින් භාවිත කිරීම් සහ අසමානුපාතික අන්දමින් බලය භාවිතා කිරීම් පිළිබඳ වාර්තාගතව ඇති තත්ත්වය තුළ තැතිගන්වන සුළු ප්‍රතිවිපාකයන් උද්ගත වීමේ හැකියාව පිළිබඳ දැඩි භයානක තත්ත්වයක් පෙන්නුම් කෙරේ.

මෙම නියෝගයන්හි 34(2) නියෝගය මගින් පෙන්වා දෙනු ලබන්නේ අදාල හදිසි අවස්ථා නියෝග ප්‍රකාරව යම් වරදක් සිදු කරන ලද බවට සැක කරන ලද හෝ චෝදනා ලැබ ඇති කිසිදු තැනැත්තකු සඳහා සුවිශේෂී අවස්ථාවන් වලදී හැර ඇප ලබා නොදිය යුතු බවය.

## නීතිපතිවරයාගේ භූමිකාව

හදිසි අවස්ථා නියෝග යටතේ තැනැත්තන් විසින් කර ඇතැයි කියන හෝ සෘජුව හෝ වක්‍රව යම් බලයක් පාවිච්චි කිරීම හෝ ක්‍රියාත්මක කිරීම හෝ කාර්යයක් කිරීම නැතහොත් උද්දේශිත ක්‍රියාත්මක කිරීම හෝ හේතුකොටගෙන හෝ එයින් උද්ගත වූ නැතහොත් ඒ ක්‍රියාත්මක කිරීමේ දී හෝ කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාවලින් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යම් වැරදි සංයුක්ත වේ ද යම් තැනැත්තන් විසින් කරන ලදැයි කියනු ලබන එවන් වැරදි, පිළිබඳ පරීක්ෂණ යම් අධිකරණයක දී පවත්වා නඩු විභාග කරනු ලැබිය යුතු බවට නීතිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකිය. ඒ අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව ඇතුළත දී එවැනි වරදවල් කරනු ලැබුවේ නම්, එම අධිකරණය ඒ සඳහා අධිකරණ බලය සහිත අධිකරණයක් විය යුතුය (නියෝග 32).

එබැවින්, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම සඳහා නීතිපතිවරයාගේ ලිඛිත අවසරය අවශ්‍ය වන නමුදු අදාළ නියමයෙහි යම් නිශ්චිත දක්වනු ලැබිය හැකි යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් මේ නියෝගයේ නීතිපතිවරයාගේ ලිඛිත අවසරයේ විධිවිධානය අදාළ නොවිය යුතු යැයි ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් ප්‍රකාශ කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් බලපවත්වන තාක් කල් එවැනි වරදකට ඒ ඡේදය අදාළ නොවිය යුතුය (නියෝග 33).

## විවිධ

### නියෝග 36

මෙම නියෝගය අඛණ්ඩව බලපවත්නා කාලය තුළ සැරයන් නිලයට නොඅඩු නිලයක සිටින යම් පොලිස් නිලධාරියකු විසින් හෝ කෝප්‍රල් නිලයට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ ප්‍රධාන නැවියෙකුට නොඅඩු තත්තත්වයක සිටින ශ්‍රී ලංකා නාවික හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ කෝප්‍රල් නිලයට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් සාමාජිකයකු විසින් හෝ යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක, මුහුදු වෙරළක හෝ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් අසළ හෝ එහි භූමියෙහි සිටින යම් නැතැන්තකුට හෝ තැනැත්තන්ට ඒ ස්ථානයෙන් ඉවත් වීමට අණ කළ හැකි අතර ඒ නියමය පිළිපැදීම, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තාගේ හෝ එක් එක් තැනැත්තාගේ යුතුකම විය යුතු යැයි නියෝග 36(1) උපවගන්තිය මගින් පෙන්වා දේ.

තවද, එකී නියෝගයෙහි (2) උපවගන්තියට අනුව, යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් එකී නියමයට අනුකූලව ක්‍රියා නොකරන්නේ නම් ඒ නිලධාරියා විසින් අවශ්‍ය වන යම් සහායක් ඇතිව, සන්නද්ධ බලය ඇතුළු බලයෙන් ඒ නියමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ හැකි අතර ඒ තැනැත්තා ඉවත් කිරීමට හෝ සිරභාරයට ගෙන රඳවා තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය හැකිය.

මෙම නියෝගය මගින් යාම ඊමේ නිදහස, සාමකාමීව රැස්වීමේ සහ සමාගමයේ යෙදීමේ නිදහස සීමා කරනු ලැබිය හැකි අතර, සමස්තයක් ලෙස මෙකී නියෝග මගින් සන්නද්ධ හමුදාවට ලබා දී ඇති පුළුල් බලතල සහ නිදහස ද තවදුරටත් වැඩි වීමක් සිදු වේ. එවැනි නියෝග බලාත්මක කිරීම සඳහා අසමානුපාතික බලය භාවිතා කිරීමට මෙවන් නියෝගයන්ගෙන් ලබා දී ඇති නිදහස සම්බන්ධයෙන් ද ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වේ.

මෙම නියෝගයෙහි (3) උපවගන්තියට අනුව, මෙම නියෝගය අඛණ්ඩව බලපවතින කාලය තුළ, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306 (1), (2) සහ (4) යන වගන්ති, වෙනත් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ එවැනි තැනැත්තකු සම්බන්ධයෙන් අදාළ නොවන යුතු බව පෙන්වා දේ. ඉහත විධිවිධානයේ ප්‍රතිඵලයක් ලෙස, අධිකරණය මගින් ''චෝදනා නගනු ලැබ ඇති තැනැත්තාගේ චරිතය, පූර්ව ක්‍රියා කලාපය, වයස, සෞඛ්‍ය හෝ මානසික තත්ත්වය හෝ වරදේ අල්ප ස්වභාවය නැතහොත් වරද කරනු ලැබූ අවස්ථාවේ පැවති මන්දිකාරක කරුණු සැලකිල්ලට ගත් විට, යහපත් හැසිරීමෙන් යුක්ත වන බවට කොන්දේසියක් සහිතව අදාළ වරදකරු නිදහස් කරනු ලැබීම'' යන අවස්ථාව මෙම නියෝගයන් යටතේ චෝදනා ලබන හෝ වරදකරුවන් කරනු ලබන තැනැත්තන්ට හිමි නොවේ.

### නියෝග 39

මෝටර් රථ ප්‍රවාහන පනතේ ඇතැම් විධිවිධාන වලින් සන්නද්ධ හමුදා සාමාජිකයන් නිදහස් කරනු ලබයි.

## නියෝග 40

(1) ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් නමින් හෝ ධූරයෙන් සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය.

(2) ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සඳහා නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් සම්බන්ධීකරණ නිලධරයකු පත් කර ඇති අවස්ථාවක දී, යම් ලිඛිත නීතියක් මගින් හෝ අන්‍යාකාරයකින් දිසාපතිවරයකු වෙත පවරා ඇති හෝ පනවා ඇති සියලු බලතල, කාර්යය හා කර්තව්‍ය එම ප්‍රදේශය තුළ දී එම නිලධරයා විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු අතර එම කාර්යය සඳහා එම ප්‍රදේශය සම්බන්ධයෙන් වන අදාළ වීමක දී එවැනි සෑම සඳහන් කිරීමක් ම එම සම්බන්ධීකරණ නිලධරයා සම්බන්ධයෙන් කරනු ලබන සඳහන් කිරීමක් ලෙස සැලකිය යුතුය.

(3) පත් කර ඇති සම්බන්ධීකරණ නිලධරයකු පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින් නමින් හෝ ධූරයෙන් ප්‍රධාන සම්බන්ධීකරණ නිලධරයකු පත් කරනු ලැබිය හැකිය.

(4) මෙම නියෝග යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රධාන සම්බන්ධීකණ නිලධරයාට සහාය වීමට අවශ්‍ය විය හැකි යම් නියෝජ්‍ය ප්‍රධාන සම්බන්ධීකාරණ නිලධරයන් සංඛ්‍යාවක් ජනාධිපතිවරයා විසින් නමින් හෝ ධූරයෙන් පත් කරනු ලැබිය හැකිය.